# ශ්‍රී ලාංකේය තාරුණ්‍යය සඳහා ධර්මපාල දැක්ම

**මංගල කීර්ති පැස්කුවෙල්**

බාහිර කථිකාචාර්ය,

ජනසන්නිවේදන අධ්‍යයන අංශය

කැලණිය විශ්වවිද්‍යාලය.

*mkdpasqual@gmail.com*

යම් රටක ඉතා වැදගත් මානව කණ්ඩායම වනුයේ එම රටේ තාරුණ්‍යයයි. ඊට හේතුව සමස්ත ශ්‍රම බලකායේ වැඩි ප්‍රතිශතයක් තරුණයන් නියෝජනය කරන නිසාය. ලංකාව සැළකුවහොත් රටේ ජනගහනයෙන් 30% ක් වයස අවුරුදු 20 - 34 මට්ටමේ වෙයි. (livepopulation.com) එම පිරිස සැලකීමේදී 2015 සමීක්ෂණ වාර්තා වලට අනුව තරුණ විරැකියාව 22.9 % කි. ධර්මපාලතුමා යනු 1864 - 1933 අතර කාලය තුළ ලංකාවේ ජීවත් වූ බුදුදහම ආරක්ෂා කිරීමට හා රට ජාතිව කෙරෙහි උන්නතිකාමී ලෙස තම කාලය, ශ්‍රමය වැයකළ පුද්ගලයෙකි. ආර්ථික, සමාජ, දේශපාලනික සංස්කෘතික ක්ෂේත්‍ර වල ඔහු විශාල කාර්යභාරයක් සිදුකර තිබේ. අනගාරික ධර්මපාලතුමාගේ දර්ශනය තුල ශ්‍රී ලාංකීය තරුණයා විෂයෙහි ඔහුගේ කාර්යභාරයට කෙබදු ආකාරයෙන් බලපා ඇත්ද? යන්න අධ්‍යයනය කළ යුත්තකි. එමගින් නූතන ලාංකීය සංවර්ධනයට එය යොදාගත හැකිද යන්න විමසා බැලීම ඒ පිළිබඳ කරුණු එක්රැස් කිරීම හා විශ්ලේෂණය කිරිම අරමුණ කොට මෙම අධ්‍යයනය සිදුකරන ලදී. ධර්මපාලතුමා විසින් ලියූ ලිපි හා සටහන් ඇසුරෙන් අන්තර්ගත විශේලේෂණයක් ලෙස මෙම අධ්‍යයනය සිදුකරන ලදී. එහිදී හෙළිදරව් වූයේ ජවසම්පන්න ක්‍රියාශීලි තාරුණ්‍යය ක්‍රියාකළ යුතු ආකාරය හා එමගින් සංවර්ධනය ළඟා කරගත හැකි බව ඔහු පෙන්වා දී ඇති බවයි. තරුණයන් පිළිබඳ ඔහුගේ දැක්ම ඉතා පුළුල් බව අධ්‍යයන තුලින් හෙලිදරව් වේ. ඒ සඳහා ඔහු දායක වූ අමද්‍යප ව්‍යාපාරය, මහාබෝධි පාසල් ඇතිකිරීම, කාර්මික ඥානය ලබාදීමට තරුණයින් පුහුණුව සඳහා ජපානයට යැවීම හා ග්‍රාමීය තරුණයින් දැනුවත් කිරීම සඳහා දේශන පැවැත්වීම, ලිපි ලිවීම, සිංහල බෞද්ධයා පුවත්පත් පටන්ගැනීම ආදිය උදාහණ ලෙස සැලකිය හැකිය.

මුඛ්‍ය පද : අනගාරික ධර්මපාලතුමා, ලාංකීය තරුණ්‍යය, විරැකියාව, අමද්‍යප ව්‍යාපාරය, කාර්මික ඥානය